## යාන්ත්‍රණය හෙවත් මුල සහසන්ධීය රාජ්‍යය

ඊනියා සුනාමි සහන මණ්ඩලය ඉතා සරල දෙයක් ලෙස හැඳින්වීමේ කොන්ත්‍රාත්තුව භාරගෙන සිටින මැති ඇමතිවරුන්ට ඇති එකම ප්‍රශ්නය කොන්ත්‍රාත්තුවේ ගණන් හිලව් හරිහැටි පියවෙන්නේ ද යන්න පමණ ය. ඒ හැරෙන්නට වෙනත් කරුණක් ඔවුන්ගේ ක්ෂුද්‍ර බුද්ධියට වටහාගැනීමේ ශක්තියක් ඇතැයි ද සිතිය නො හැකි ය. සුසාන මණ්ඩල පිළිබඳ විශ්ලේෂණයක් කිරීමට මට කලින් අවශ්‍ය නො වූයේ ඒ සඳහා බොහෝ දෙනා ඉදිරිපත්වන නිසාත් සුසාන මණ්ඩලය පිහිටුවීම පිටුපස ඇති දේශපාලනයෙහි සමස්තය පිළිබඳ කතාකිරීම වැදගත් වූ නිසාත් ය. සුසාන මණ්ඩලයෙන් සිදුවන්නේ පසුකාලයක එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි බටහිර ක්‍රිස්තියානි ලෝකයේ ආධිපත්‍යය යටතේ ඇති ආයතනයක් හරහා හෝ වෙනත් ආකාරයකට හෝ ඊළම ලබාගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි ගොනුකරගැනීම ය. දරුවකු පාසලකට ඇතුළත්කිරීම සඳහා අවශ්‍ය ලේඛන සකස් කරන දෙමව්පියන් මෙන් දෙමළ ජාතිවාදීහු හා බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීහු දැන් කලක සිට ඊළම පිහිටුවීම සඳහා අවශ්‍ය ලේඛන සම්පාදනයකරමින් සිටිති.

මේ ලේඛන අතර රනිල් වික්‍රමසිංහ ප්‍රභාකරන් අවබෝධතා ගිවිසුමට හිමිවන්නේ ඉතා වැදගත් තැනකි. ඒ ගිවිසුම කෙටුම්පත්කළ නොර්වේ ජාතිකයන්ට හා අනෙක් අතවැසි අඟුටුමිට්ට උගතුන්ට ගිවිසුම පිළිබඳ හොඳ අවබෝධතාවක් තිබෙන්නට ඇත. ගිවිසුම ඔස්සේ ඊනියා ලංකාණ්ඩුවට (දිනේෂ් ගුණවර්ධන මහතා වරක් පැවසුවේ ලංකාවේ ආණ්ඩුවක් ඇත්තේ සියඹලාන්ඩුවේ පමණක් බව ය. සන්ධානය බලයට පත්වීමෙන් පසුව ද තත්ත්වයෙහි වෙනසක් සිදු වී නැත.) හා කොටි සංවිධානයට සම තත්ත්වය හිමි වූ අතර රටේ හමුදාවට හා කොටි ත්‍රස්තවාදීන්ට සම තත්ත්වය ලැබුණි. සුසාන මණ්ඩල ඔස්සේ ආණ්ඩුවේ පරිපාලනයට හා කොටින්ට සම තත්ත්වයක් ලැබෙන බව අපි දැන සිටියෙමු. පසු දිනෙක බටහිරයන්ගේ දේශපාලන අතකොළුවක් ලෙස කටයුතුකෙරෙන එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි හෝ වෙනත් තැනක මේ ලියවිලි ඉදිරිපත්කෙරෙනු ඇත්තේ ඊනියා ජාත්‍යන්තරයෙහි ඊළමට පිළිගැනීමක් ලබාදීමට ය.

සුසාන මණ්ඩල ගිවිසුම විශ්ලේෂණයකරන විට එහි සමස්ත දේශපාලන රටාව ඉහත සඳහන් දෙයින් වෙනස් නොවුණ ද තත්ත්වය වඩාත් බරපතල බව පෙනී යයි. ඒ සුසාන මණ්ඩල ව්‍යූහය හා සංයුතිය දෙමළ ජාතිවාදීන්ට අවශ්‍ය සහසන්ධානය දැනටමත් මුල (ප්‍රොටෝ) අවස්ථාවකින් එමගින් පිහිටුවා ඇති බැවින් ය. අනෙක් අතට ගිවිසුමෙන් සිංහලයන් මෙරට අඩුතරමින් ජනවර්ගයක් ලෙස හෝ නොසැලකෙන බැවින් ය. දෙමළ ජාතිවාදීන් දහනවවැනි සියවසරේ ව්‍යවස්ථාදායක සභාව පිහිටු වූ කාලයෙහි සිට ම වෑයම්කර ඇත්තේ එහි සිංහල නියෝජනත්වය ඉතා අඩු මට්ටමක තබාගැනීමට ය. මුල් ම ව්‍යවස්ථාදායක සභාවට බ්‍රිතානීහු සිංහල ජාතිය සඳහා එක් නියෝජිතයකු ද, දෙමළ ජනවර්ගය සඳහා එක් නියෝජිතයකු ද, බර්ගර් ජනවර්ගය සඳහා එක් නියෝජිතයකු ද පත්කළහ. එහි දී ඔවුහු සිංහලයන්ගේ ජන අනුපාතය හෝ සිංහලයන් මේ රටේ අවුරුදු දෙදහසකට වඩා ජීවත්ව සිටි බව, මෙරට සංස්කෘතියක් ගොඩනැගුවේ සිංහලයන් බව ආදී කරුණු නොසලකා හැරියහ.

ඉන්පසු දෙමළ ජාතිවාදීහු පොන්නම්බලම් අරුණාචලම් මහතාගෙන් පටන්ගෙන මධ්‍යයෙහි සිංහල නියෝජනත්වය අඩුකිරීමට උත්සාහ කළහ. අරුණාචලම් මහතා පළමුවෙන් ම ව්‍යවස්ථාදායක සභාවට කොළඹ පළාත වෙනුවෙන් වෙනම දෙමළ මන්ත්‍රීවරයකු ඉල්ලා සිටියේ ය. ඉන්පසු ඔවුහු මැනිං ආණ්ඩුකාරයා සමග කුමන්ත්‍රණය කළෝ සිංහල නියෝජනත්වය ව්‍යවස්ථාදායක සභාවෙහි අඩුකිරීමට කටයුතු කළහ. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ දී දෙමළ ජාතිවාදීහු ජී ජී පොන්නම්බලම් මහතාගේ නායකත්වයෙන් පනහට පනහ ඉල්ලා සටන්කළහ. තමන්ට මධ්‍යයෙහි බලය තහවුරුකරගැනීමට නොහැකි බව තේරුම්ගත් චෙල්වනායගම් මහතා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවා උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් පිහිටුවීමට කටයුතු ආරම්භ කෙළේ ය.

එදා දෙමළ ජාතිවාදීන්ට අවශ්‍ය වූ දේ අද නොර්වේ ඔස්සේ බටහිර ජාතීහු ඉටුකරදෙති. අප සැමදාමත් කී පරිදි නෝර්වේ යනු බටහිර කතෝලික නොවන ක්‍රිස්තියානි රාජ්‍යවල නියෝජිතයා පමණකි. හොඳ හොඳ නැටුම් එළිවෙන ජාමෙට යැයි කීවාක් මෙන් බටහිරයන්ගේ ක්‍රියාදාමය දැන් දැන් හෙළිදරවු වෙමින් පවතියි. සුසාන මණ්ඩල ඔස්සේ බටහිර ක්‍රිස්තියානි රටවල් අප රටට බලපෑම් කරයි. ඒ මගින් මෙරට දේශපාලනය හසුරවයි. අප රටේ ස්වෛරීභාවයක් නැත. ආණ්ඩුවට අද කළ හැක්කේ ආයුධ නොමැත්තන්ට පොලීසිය හා හමුදාව යොදවා පහර දීම

© Prof. Nalin De Silva

පමණ ය. ආණ්ඩුව යැයි කියන ආයතනයට ප්‍රභාකරන්ට පහරදිය නො හැකි ය. ඒ ඔහු බටහිරයන් විසින් රැකෙන බැවින් ය.

සුසාන මණ්ඩලය පිහිටුවා ඇත්තේ සුනාමි ආධාර බෙදීමට නොවන බව පැහැදිලි ය. උතුරු හා නැගෙනහිර පළාත්වල සුනාමි ආධාර බෙදීමට ඔය කියන මණ්ඩලය නොමැති වුවාට ආණ්ඩුවේ පාලන තන්ත්‍රයට හැකි ය. සුසාන මණ්ඩලවල ව්‍යුහය මුමනින් ම දෙමල ජාතිවාදීන්ට අවශ්‍ය ආකාරයට සැකසී ඇත. එහි ප්‍රධාන කමිටුව, දිස්ත්‍රික් කමිටුව හා ප්‍රාදේශීය කමිටු යනු ස්ථර තුනක කමිටු වෙයි. සුසාන මණ්ඩල පිහිටුවන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල සුනාමි ආධාර බෙදීමට නම් ප්‍රධාන කමිටුවක් අවශ්‍ය වන්නේ ඇයි? අප එසේ අසන්නේ ප්‍රධාන කමිටුවේ බල ප්‍රදේශය මුළු දිවයිනේ ම සුනාමි බලපෑමට පාත්‍ර වූ ප්‍රදේශවීම නිසා ය. සුනාමියෙන් ආපදාවට පත්වූ වෙරළබඩ ප්‍රදේශ පමණක් නොව සුනාමියෙන් ආපදාවට පත්වූ පුද්ගලයන් පදිංචිවන පදිංචිකෙරෙන පළාත් ද ප්‍රධාන බල කමිටුවේ බල ප්‍රදේශය වෙයි. එමෙන් ම සුනාමි ආපදාවට පත්වූ මුහුද හා වරාය ද ප්‍රධාන කමිටුව යටතට පත්වෙයි. මෙයින් කියැවෙන්නේ ගාල්ල හා අකෙනුත් වරාය ද ප්‍රධාන කමිටුව යටතට පත්වන බව ය. ඉතා කෙටියෙන් කියන්නේ නම් ලංකාවේ මුහුදුබඩ තීරය හා මුහුද මුළුමනින් ම මෙන් ප්‍රධාන කමිටුවට අයත් බල ප්‍රදේශ වෙයි. කවුරුන් හෝ ප්‍රධාන කමිටුව උතුරු හා නැගෙනහිර පළාතේ මුහුදුබඩ කිලෝමීටර දෙකකට සීමාවන්නේ යැයි පවසන්නේ නම් ඒ පට්ටපල් බොරුවකි. ප්‍රධාන කමිටුවට අවශ්‍යතාව පරිදි තව ප්‍රදේශ ද තම බල ප්‍රදේශයට එකතුකර ගත හැකි බැවින් මෙහි භයානකකම තවත් වැඩිවෙයි.

එසේ වූ ප්‍රධාන කමිටුවෙහි සංයුතිය කවරක් ද? එහි ආණ්ඩුවේ නියෝජිතයෙක් වෙයි. ඒ අතර කොටි සංවිධානයේ නියෝජිතයෙක් හා මුස්ලිම් නියෝජිතයෙක් වෙති. මේ ආණ්ඩුව කෙසේවත් සිංහලයන්ගේ ආණ්ඩුවක් නො වෙයි. එය සිංහලයන්ගේ බහුතර ඡන්දයෙන් පත්වූ බව වෙන ම කරුණක් වෙයි. එහෙත් එහි ප්‍රධානීහු සිංහල විරෝධීහු මෙන් ම බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ගේ සුකිරි බට්ල්ලෝ ද වෙති. එහි සිටින ලොම් හැළුණු මාක්ස්වාදීන්ට තනියම තරගකර ඡන්ද දහසක් ලබාගැනීමට නො හැකි ය. ඔවුහු ද අද බටහිරයන් වෙනුවෙන් කඩේ යති. කෙසේ හෝ ප්‍රධාන කමිටුවේ එක් සිංහල නියෝජිතයකු හෝ නැත. ආණ්ඩුවෙන් පත්කරන්නා නියෝජනය කරන්නේ පාන්ඩුව මිස සිංහලයන් නො වෙයි. බ්‍රිතානීහු ද අඩුම තරමින් ඔවුන් පිහිටු වූ ව්‍යවස්ථාදායක සභාවට සිංහල නියෝජිතයකු පත්කළහ. සුසාන මණ්ඩලයට බටහිරයන් දෙමළ ජාතිවාදීන් සමග එකතු වී එක් සිංහල නියෝජිතයකු හෝ පත් නොකිරීමට කටයුතු කර ඇත.

මේ ගිවිසුමට අත්සන් තබා ඇත්තේ ආණ්ඩුව හා කොටි පමණ ය. මුස්ලිම් නියෝජිතයකුටවත් එයට අත්සන් කිරීමට කොටි ඉඩ නො දුන්හ. ඉතා පැහැදිලිව ප්‍රධාන කමිටුව යනු සහසන්ධීය රාජ්‍යයක මුල අවස්ථාව ය. එය වර්ධනය වී විකශය වී සහසන්ධීය රාජ්‍යයක් බවට පත්වනු ඇත. මේ මණ්ඩලවල කාලය අවුරුද්දකට පමණක් කෙසේවත් සීමා නොවනු ඇත. ප්‍රධාන කමිටුව යනු පෙර අවස්ථාවල දී පිහිටුවීමට තැත්කළ කුට මණ්ඩලය (එපෙක්ස් බොඩි) ආදී නම්වලින් හඳුන්වනු ලැබූ ආයතනය මිස අනෙකක් නො වෙයි. කිලිනොච්චියේ පිහිටුවා ඇති දිස්ත්‍රික් මණ්ඩලය මූල ඊලාම් රාජ්‍යය වෙයි. එහි සභාපති නිලබලයෙන් කොටි නියෝජිතයෙක් වෙයි. එහි තවත් කොටි නියෝජිතයන් හතර දෙනකු වන අතර මුස්ලිම් නියෝජිතයෝ තිදෙනෙක් වෙති. එයට අමතරව ආණ්ඩුව නම් නරිනාටකයේ නියෝජිතයෝ දෙදෙනෙක් වෙති. ඔවුන්ගෙන් එක් අයකු ලෙස මුස්ලිම් වර්ගයට අයත් තැනැත්තකු පත්කිරීමට ආණ්ඩුව එකඟ වී ඇත. ඊනියා ප්‍රාදේශීය මණ්ඩල යනු මූල ඊළමේ පළාත් සභා වෙයි. සුනාමි ආපදා කටයුතු සඳහා මෙතරම් සංකීර්ණ මණ්ඩලයක් පිහිටුවිය යුතු ද? දෙමළ ජාතිවාදයට මුලින් ම අවශ්‍යවන්නේ සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීමට ය. ඉන්පසු එහි ඊළමට ප්‍රශ්නයක් නොමැතිව සහසන්ධීය රාජ්‍යයෙන් වෙන්විය හැකි ය. ඊනියා අසමමිතික බලය බෙදීම ලෙස ද කලක් කතාකෙරුණේ මේ සහසන්ධීය රාජ්‍යය ගැන ය. සුනාමිය සිංහලයන්ට හා මුස්ලිම් ජනයාට බෙදවාචකයක් වුව ද දෙමළ ජාතිවාදයට හා බටහිර ක්‍රිස්තියානි රාජ්‍යවලට දේවාශීර්වාදයක් වී ඇත. සුනාමි ලියැවිල්ල දෙමළ ජාතිවාදීන්ගේ අතෙහි වූ වැදගත් ලේඛනයකි. පසුව එය මෙරට 2005 සිට සහසන්ධීය රාජ්‍යයක් අඩුම තරමින් මූල අවස්ථාවේ පැවති බවට සාක්ෂියක් ලෙස බටහිර ක්‍රිස්තියානි රාජ්‍යයවලට ඉදිරිපත්කරනු ඇත.

© Prof. Nalin De Silva